# 1.13 නිශ්චල ඡායාරූපකරණයේ නියැලෙන ආධුනිකයින් මුහුණපාන ගැටලු පිළිබඳ කෙරෙන අධ්‍යයනයක්

එන්.ජේ.එච්. මහේෂ් ප්‍රසන්ත
නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ඡායාරූප කලාව හැදෑරීම්වල දී සහ ක්ෂේත්‍රගත ක්‍රියාකාරකම්වල දී ආධුනිකයන්ට මුහුණපෑමට සිදුවන ගැටලු රාශියකි. ඒවා ඡායාරූප ශිල්ප විෂයෙහි අධ්‍යයන ගෝචර ආකෘතිය මත පිහිටා හඳුනාගැනීම සහ විසඳුම්, යෝජනා කිරීම මෙම පර්යේෂණයේ අභිමතාර්ථය වේ.

**ප්‍රතිබිම්බ කලාවේ මූලධර්ම ප්‍රධාන කොටස් තුනක් යටතේ වර්ග කළ හැක.**

**ප්‍රතිබිම්බ කලාවේ මූලධර්ම**

01. ප්‍රතිබිම්බය ගොඩනැගීම - භෞතික විද්‍යාත්මක න්‍යාය
02. ප්‍රතිබිම්බය ලේඛනගත කිරීම - රසායන විද්‍යාත්මක හා අංකිත න්‍යාය
03. ප්‍රතිබිම්බයක ව්‍යවහාරික වටිනාකම - මනෝ විද්‍යාත්මක, මානව විද්‍යාත්මක, සන්නිවේදනාත්මක හා සමාජ විද්‍යාත්මක විභවතා හා සීමා

**01. ප්‍රතිබිම්බය ගොඩනැගීම පිළිබඳ මූලික අවබෝධයක් නොමැතිකම නිසා ඇතිවන ගැටලු**

- විවිධ කැමරා කාච වර්ග භාවිතය පිළිබඳ ගැටලු
- විවිධ තාක්ෂණික කැමරා වර්ග භාවිතය පිළිබඳ ගැටලු
- නිශ්චල කැමරාව පරිහරණය සම්බන්ධ ගැටලු
- විද්‍යුත් ක්ෂණිකාලෝක එල්ල ඇතුළු අමතර උපාංග භාවිතය පිළිබඳ ගැටලු

**02. ප්‍රතිබිම්බය ලේඛනගත කිරීම සම්බන්ධව පවතින ගැටලු**

- පටල පටි අධි අනාවරණය සහ මන්ද අනාවරණය පිළිබඳව පැනනගින ගැටලු
- නාභිගත කිරීම, කාච විවරය, ද්වාරය හරියාකාරව භාවිත නොකිරීම සම්බන්ධ ගැටලු
- විවිධ දළසේයාපට වර්ග සහ ඒවා භාවිත කරන විවිධ අවස්ථාවන් පිළිබඳ ගැටලු
- ඡායාරූප මුද්‍රණය සහ රසායනාගාර පිළිබඳ පවතින ගැටලු
- අංකිත තාක්ෂණය යටතේ රූප ග්‍රහණය කිරීම හා සම්බන්ධ ගැටලු
- අංකිත තාක්ෂණයට අනුව රූප සංස්කරණය, පිටපත්කරණය අවස්ථානුකූලව යොදාගැනීම පිළිබඳ ගැටලු.

**03. ප්‍රතිබිම්බයක ව්‍යවහාරික වටිනාකම පිළිබඳ ගැටලු**

- රූප සංරචනය පිළිබඳ අවබෝධයක් නොමැතිකම
- කැමරාවේ ආලෝක පාලන උපාංග හැසිරවීමෙන් ලැබෙන ප්‍රතිඵල පිළිබඳ අවබෝධයක් නොමැතිකම
- කලාත්මක වාණිජ ඡායාරූපකරණය පිළිබඳ අවබෝධයක් නොමැතිකම
- ඡායාරූප කලාවේ විවිධ ක්ෂේත්‍ර හා ඒවායේ නියැලෙන විට තමා විසින් සපුරාගත යුතු න්‍යායික හා ප්‍රායෝගික ශක්‍යතාව පිළිබඳ ලුහුඬුතා
- වර්තමාන ඡායාරූපය නූතන සන්නිවේදන මාධ්‍යයක් ලෙස කෙසේ භාවිත කළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් නොමැතිකම.
- අන්තර්ජාලයේ සිය ඡායාරූප සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර නොගැනීම.

**ලාංකික ඡායාරූප ශිල්ප උප සංස්කෘතිය පුරා දක්නට ලැබෙන යථෝක්ත ගැටලු පිටුදකිනු වස් ඉදිරිපත් කළ හැකි විසඳුම් හා යෝජනා මතු දැක්වේ.**

- පාසැල් මට්ටමේ සිට ඡායාරූපකරණ වැඩමුළු, සංගම්, දේශන, ප්‍රදර්ශන, පැවැත්වීම හා පාසැල් සහ උසස් අධ්‍යාපන විෂය මාලාවට විෂයක් ලෙස ඡායාරූපකරණය ඇතුළත් කිරීම.

- ජාතික මට්ටමින් විවිධ ඡායාරූප සංගම් බිහිකිරීම හා ඒවාට අවශ්‍ය අමුද්‍රව්‍ය, පහසුකම්, හා මූලික ප්‍රාග්ධනය යෙදවීම.

- අන්තර්ජාතික ඡායාරූප සංගම් සමග සම්බන්ධතා පැවැත්වීම.

- දේශීය, විදේශීය ප්‍රවීණ ඡායාරූප ශිල්පීන්ගේ ඡායාරූප ප්‍රදර්ශන, හා වැඩමුළු පැවැත්වීම.

- ඡායාරූපකරණ විෂය පිළිබඳ අවබෝධයක් ග්‍රාමීය ජනතාවට ලබාදීම සහ ඔවුන් ඡායාරූපකරණ ක්ෂේත්‍රයට යොමු කරවීමේ ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම.

- විවිධ භාෂාවලින් මුද්‍රිත ඡායාරූපකරණය සම්බන්ධ ලිපිලේඛන, සඟරා, පොත්පත්, ඡායාරූපකරණ විෂය ක්ෂේත්‍රයට පිවිසෙන ආධුනික ශිල්පීන්ට පරිශීලනය කිරීමේ පහසුකම් ඇති කිරීම.

- වෘත්තීය ආදායම් මාර්ගයක් ලෙස හා විෂයික විෂයක් ලෙස ඡායාරූපකරණ විෂය ක්ෂේත්‍රයේ ඇති වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබාදීම.

- මහජනතාව ගැවසෙන ප්‍රධාන ස්ථානවල දේශීය උරුමය විදහාපාන ඡායාරූප ප්‍රදර්ශනය කිරීම මගින් දේශීයත්වය පිළිබඳ හැඟීම් ඇතිකරලීම හා ඡායාරූප ශිල්පය යනු වින්දනාත්මක හා සමාජානු යෝජනා කාරකයක් යන මතය ස්ථාපිත කිරීම.